භාවිතයෙන් ඉවත් කළ අබලි ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් අලෙවි කිරීම.
කොන්දේසි මාලාව.

01. 2026.11.13 දින ප්‍රසිද්ධ කරන ලද දැන්වීම පරිදි මෙම අධිකාරියට අයත් භාවිතයෙන් ඉවත් කළ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ අලෙවි කරනු ලැබේ. අදාල භාණ්ඩ අංක 493, 493/1 පරිශ්‍රයේ ගබඩා කර ඇත. භාණ්ඩ පරීක්ෂා කිරීම 2026.11.16 දින පෙ.ව.9.00 සිට 2026.11.30 දින ප.ව.3.00 දක්වා ඉහත පරිශ්‍රයන්හිදී සිදු කල හැක. (වෙන්දේසිය ආරම්භ වූ පසු භාණ්ඩ පරීක්ෂා කිරීම් කල නොහැකිය.)

02. වෙන්දේසියට ඉදිරිපත් වීම සඳහා රු.250.00 ක් ගෙවා ලබා ගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කර ගණකාධිකාරී (වත්කම්) වෙත ලබා දිය යුතු අතර එහි දී වෙන්දේසියට ඉදිරිපත් වීමේ අවසර පත්‍රය නිකුත් කරනු ලබයි.

03. භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා වෙන්දේසියට ඉදිරිපත් වීමේ අවසර පත්‍රය තිබීම අනිවාර්ය වන අතර වෙන්දේසිය සිදු කරන දිනයේ දී ඇතුල් වීමේ අවසර පත්‍රය ලෙස මෙය රැගෙන ඒම අනිවාර්ය වේ.

04. ඔබ විසින් ඉදිරිපත් කරන මිල ඉහලම මිල වශයෙන් වෙන්දේසිකරු සනාථ කල පසු එම අවස්ථාවේ දීම ඔබ විසින් ඉදිරිපත් කරන ලද මිලට අදාළ මුදල් ගෙවීම් කටයුතු සිදු කල යුතුයි.

05. එම අවස්ථාවේ දී මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් එම තීරණය අවලංගු කර නැවත වෙන්දේසිය සඳහා යොමු කිරීමට කටයුතු කරන අතර ගෙවීමට අපොහොසත් වූ අයදුම්කරුට ඒ සඳහා නැවත ඉල්ලීම් කල නොහැක.

06. ඔබ විසින් මුදල් ගෙවූ භාණ්ඩ එදින ප.ව. 3.30ට පෙර අදාළ භාණ්ඩ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීම සිදු කල යුතුයි.

07. එදින ඉවත් කර නොගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දරනු නො ලැබේ.

08. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් විසින් වෙන්දේසි භාණ්ඩ ඉල්ලීම් කරන්නේ නම් ලබා ගන්නා භාණ්ඩ ආයතන පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීම අනිවාර්ය වන අතර නැවත කාර්යාල පරිශ්‍රය තුල භාවිතා කිරීම කල නොහැක.

09. වෙන්දේසි භාණ්ඩ ලොට් වශයෙන් ඉදිරිපත් කරන අතර තේරී පත් වන අයදුම්කරුවන් ලොට් එකට අදාළ සියළුම භාණ්ඩ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුය.

10. අවම තක්සේරු වටිනාකම නොලැබෙන වෙන්දේසි භාණ්ඩ වෙන්දේසි ක්‍රියාවලියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය වෙන්දේසි කමිටුව සතුය.

11. ප්‍රසිද්ධ වෙන්දේසිය 2026.12.01 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අංක 493, 493/1 පරිශ්‍රයේදී පෙ.ව.10.00 ට ආරම්භ වන අතර ඔබ වෙත ලබා දී ඇති අවසර පත්‍රය සඳහා ඔබ සහ අයදුම්පත්‍රයේ නම් කල අයට පමණක් එම අවස්ථාවට සහභාගී වීමට හැකියාව ඇති අතර මිල ගණන් ඉදිරිපත් කල හැකි වන්නේ දෙදෙනාගෙන් එක් ආයෙකුට පමණි.

REFERENCE ONLY

12. අයදුම්කරුවන් වයස අවු: 18 ට වැඩි විය යුතුයි.

13. වෙන්දේසි භූමියෙන් එම භාණ්ඩ ඉවත් කර ගැනීම සඳහා ගේට්ටු අවසර පත් එම අවස්ථාවේ දීම වෙන්දේසි කමිටුව මඟින් නිකුත් කරනු ලැබේ.

14. වෙන්දේසි භූමියේ දී විනයගරුක ව හැසිරිය යුතු අතර ලංසුකරුවන්ට අනවශ්‍ය බලපෑම් කිරීම, තර්ජන කිරීම, කලහකාරී ලෙස හැසිරීම නොකල යුතු අතර එවැනි හැසිරීම් පෙනී යන්නේ නම් වෙන්දේසි භූමියෙන් එම අයදුම්කරුවන් ඉවත් කිරීමට වෙන්දේසි කමිටුවට බලය ඇත.

15. භාණ්ඩ පරීක්ෂා කර මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර , ඉවත් කර ගැනීම ප්‍රමාද වීම නිසා වෙන්දේසි භාණ්ඩ වලට සිදු වන අඩුපාඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වග කියනු නොලැබේ.

16. වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ඕනෑම අයිතමයක් වෙන්දේසි ක්‍රියාවලියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරයේ අධ්‍යක්ෂ ජනරාල් සතුයි.

17. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී මතු වන ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

REFERENCE ONLY

එච්.එම්.ජේ.කේ.හේරත්,
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය